# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2379/29 - 2024 අප්‍රේල් මස 10 වැනි බදාදා - 2024.04.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2000 අංක 49 දරන සංශෝධිත 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 45 වන වගන්තිය යටතේ වන අතුරු සංවර්ධන නියෝගය

2000 අංක 49 දරන පනතින් සංශෝධිත, 1946 අංක 13 දරණ නගර හා නිර්මාණ ආඥාපනතේ 45 වන වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මම, මෙහි සඳහන් නියෝගයෙහි දැක්වෙන I වන උපලේඛනයෙහි සඳහන් කර දක්වා ඇති නැගෙනහිර පළාතේ කලාපීය සංවර්ධන ප්‍රදේශය තුළ පිහිටි ඉඩම්වල භෞතික සංවර්ධනයට අදාළ (මෙහි මින් මතු 'සාමාන්‍ය අතුරු' සංවර්ධන නියෝගය වශයෙන් සඳහන් කරනු ලබන) සාමාන්‍ය 'නියෝගය' මෙම නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරමි.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 02 වන දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල.

නියෝගය

1. මෙම නියෝගය 2024 නගර හා ග්‍රාම නිර්මාණ (සාමාන්‍ය අතුරු සංවර්ධන) නියෝගය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝගය ( I වෙනි උපලේඛනයේ සඳහන් කර දක්වා ඇත්තාවූ) ආඥාපනත හා සංශෝධිත පනතේ විධිවිධාන යටතේ සම්පාදනය කරනු ලබන සවිස්තර සැලසුම්වලට අදාළ වන නැගෙනහිර පළාතේ කලාපීය සංවර්ධන ප්‍රදේශය තුළ පිහිටා ඇත්තාවූ ඉඩම් සඳහා අදාළ වනු ඇත.

3. ආඥාපනත යටතේ සම්පාදනය කිරීමට නියමිත සැලැස්මකට අදාළ කවර හෝ ප්‍රදේශයක අතුරු සංවර්ධන සම්බන්ධයෙන් විශේෂ අතුරු සංවර්ධන නියෝග කරනු ලැබෙන කල්හි, පූර්වෝක්ත විශේෂ නියෝගයෙහි සඳහන් කර දක්වා ඇති කවර හෝ වෙනස් කිරීමකට යටත්ව, කවර හෝ පමණකින් මෙම නියෝගයෙහි විධිවිධාන, එකී ඉඩම් සම්බන්ධයෙන් අදාළ වනු ඇත.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. මෙම නියෝගය අදාළ වන්නා වූ කවර හෝ අතුරු සංවර්ධනය සඳහා වගකීම් දරන බලධාරියා (මෙහි මින් මතු 'අතුරු සංවර්ධන' බලධාරියා සඳහන් වන)

   (අ) එකී ඉඩම කවර හෝ 'ප්‍රධාන මාර්ග සංවර්ධන ප්‍රදේශයක' පිහිටා ඇත්තේ වී නම් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වන අතර

   (ආ) 'අ' උප වගන්තියෙහි සඳහන් කර දක්වා ඇති කවර හෝ සංවර්ධන ප්‍රදේශයක එකී ඉඩම පිහිටා නොමැත්තේ වී නම් එකී ඉඩම පිහිටා ඇති පරිපාලන සීමා ඇතුළත් කලාපය සඳහා ආඥාපනතේ 12 වැනි වගන්තියේ විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කලාපීය සැලසුම් කමිටුවේ (මෙහි මින් මතු 'සැලසුම් බලධරයා' ලෙස හඳුන්වනු ලබන) අධීක්ෂණය යටතේ එම පරිපාලන සීමාව තුළ වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විය යුතුය.

5. මෙම නියෝගයෙහි 2 උපලේඛනයේ සඳහන් කර දක්වා ඇති කවර වර්ගයකට හෝ විස්තරයකට අදාළ වන්නා වූ සංවර්ධනයක් සේ සැළකිය හැකි අතුරු සංවර්ධන මෙම නියමයට අදාළ වන කවර හෝ ඉඩමකට හෝ ඉඩමක් තුළ හෝ ඉඩමක් සම්බන්ධයෙන් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

6. මෙම නියෝගයෙහි සඳහන් කවර හෝ විධිවිධානයක් මගින් හෝ එකී කලාපයට අදාළ වන්නා වූ කවර හෝ විශේෂ අතුරු සංවර්ධන නියෝගයන් මගින් හෝ බලධරයා විසින් හෝ එකී කවර හෝ විධිවිධානයක බලධරයා ලෙසට සඳහන් කරනු ලබන නිලධරයා විසින් හෝ සම්පාදනය කරනු ලබන සැලැස්මට අදාළ ප්‍රදේශය තුළ වන අතුරු සංවර්ධනයන් නියාමනය කිරීම පිළිබඳව, වගකිව යුතු නිලධාරියෙකු විසින් කරන ලද බලපත්‍රයක් මගින් බලය පවරනු ලැබ ඇත්තේ නම් මිස,

   වෙනත් කවර හෝ ලිඛිත නීතියක, කවර ආකාරයකින් සඳහන් වුවද, කවර හෝ සංවර්ධන කලාපයක් සඳහා සැලැස්මක් සම්පාදනය කරනු පිණිස වන නියමයන් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයේ සිට ආරම්භව, ඒ පරිදි සම්පාදිත සැලැස්ම ක්‍රියාත්මක වන දිනයන්හිදී අවසන් වන කාල පරිච්ඡේදය තුළ, කවර හෝ අවස්ථාවකදී, කවර හෝ පුද්ගලයෙක් විසින්,

   (අ) එකී ප්‍රදේශයේ කවර හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීම, නැවත ඉදිකිරීම, කඩා දැමීමට, වෙනස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම හෝ;

   (ආ) එකී ප්‍රදේශය තුළ පිහිටි කවර හෝ පාරක් සැලසුම් කිරීම, ඉදිකිරීම, පළල් කිරීම, දීර්ඝ කිරීම හෝ වසා දැමීම හෝ සැළසුම් කිරීමට, ඉදිකිරීමට, පළල් කිරීමට, දීර්ඝ කිරීමට හෝ වසා දැමීමට උත්සහ කිරීම හෝ;

   (ඇ) ඉඩමේ යම් කොටසක් වෙනම හිමිකමක් බවට පත් වන පරිදි, එම ප්‍රදේශයේ ඕනෑම ඉඩමක් සංවර්ධනය කිරීම හෝ උප-බෙදීම, පැවරීම, භාවිතය හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම හෝ ගණුදෙනු කිරීම;

   සඳහා කවර ලෙසකින් හෝ කටයුතු නොකළ යුතුය.

   එසේ කිරීමට අවසර දී නොමැති නම්, මෙම නියෝගයේ අඩංගු කිසියම් විධිවිධානයකින් හෝ එම ප්‍රදේශයට අදාළ වන කිසියම් විශේෂ අතුරු සංවර්ධන නියෝගයකින් හෝ මෙම බලපත්‍රය ලබාදෙන බලධාරියා හෝ නිලධාරියා හෝ එවැනි යම් විධිවිධානයක නිශ්චිතව දක්වා ඇති බලධාරියා හෝ නිලධාරියා සැලැස්ම පිළියෙල කිරීමට නියමිත ප්‍රදේශයේ ඉඩමේ අන්තර්කාලීන සංවර්ධනය නියාමනය කිරීම සඳහා වගකිව යුතු වේ.

7. 06 වැනි වගන්තියේ සඳහන් කර දක්වා ඇති කාල පරිච්ඡේදය තුළ, කවර හෝ අවස්ථාවකදී, එකී වගන්තියේ හෝ එකී ප්‍රදේශය වෙත අදාළ වන එකී නියෝගයේ කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කරමින් කවර හෝ සංවර්ධන ප්‍රදේශයක කවර හෝ ඉඩමක හෝ ගොඩනැගිල්ලක හෝ එය සම්බන්ධයෙන් හෝ කවර හෝ කටයුත්තක් ක්‍රියාත්මක කිරීමට හේතුකාරක වන හෝ අවසර දෙනු ලබන කවර හෝ ක්‍රියාකාරකමක් ඔහු හෝ ඇය විසින් ක්‍රියාත්මක කරනු ලැබීම මගින්, ආඥාපනතේ 81 වගන්තිය යටතේ කවර හෝ පුද්ගලයෙක් වරදකරු බවට පත්වන අතර, බලධරයා විසින් හෝ එකී ප්‍රදේශය තුළ අතුරු සංවර්ධනය නියාමනය කිරීම පිළිබඳව වගකිව යුතු නිලධාරියා හෝ විසින් කරන ලද ඉල්ලීමක් මත, එම ඉල්ලීමෙහි දක්වා ඇති කාල සීමාව තුළ, එකී ඉදිකිරීම වෙනස් කරන ලෙසට හෝ කඩා ඉවත් කරන ලෙසට හෝ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකිය.

8. 07 වැනි වගන්තිය යටතේ කරන ලද අධිකරණ නියෝගයක් මගින්, එකී ගොඩනැගිල්ල වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීමට කටයුතු කරන ලෙස කවර හෝ පුද්ගලයෙකු හට නියෝග කරනු ලබන කල්හි, එකී නියෝගයෙහි සඳහන් කර දක්වා ඇති කාල සීමාව තුළ, එපරිදි ක්‍රියා කිරීමට අදාළ පුද්ගලයා විසින් කටයුතු කරනු නොලැබේ නම්, එකී ගොඩනැගිල්ල වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම පිණිස කටයුතු කිරීමට නියෝගය නිකුත් කිරීමට හේතු කාරක වූ ඉල්ලීම

ඉදිරිපත් කළ බලධරයාට හෝ නිලධාරියාට හැකි වේ. එසේ වෙනස් කිරීම හෝ ඉවත් කිරීම හෝ කඩා දැමීම හෝ පිණිස දරන සියළුම වියදම් මූලික වශයෙන් එකී පුද්ගලයාගේ දේපළ මත වන භාරයක් වන අතර, රෙගුලාසි මගින් විධිවිධාන සලසන ලද ආකාරයට එකී පුද්ගලයා වෙතින් ආපසු අයකර ගත හැකි වේ.

9. මෙම නියෝගයෙහි විධිවිධානවලට අතිරේකව 1915 අංක 19 දරන නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ වන කවර හෝ සංවර්ධන පාලනයක්, එකී නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ වන ප්‍රවර්ථන කලාපකරණ අතුරු නීති ද සහ / හෝ නාගරික සංවර්ධන අධිකාරිය නීති යටතේ වන සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ද, (දැනටමත් ක්‍රියාත්මකව පවති නම්) අතුරු සංවර්ධන බලධාරියා විසින් ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදේශයක් ලෙස, මෙම නියෝගයෙහි 2 වැනි වගන්තිය මගින් සඳහන් කර දක්වා ඇති පරිදි ප්‍රදේශ තුළ ඇති වන සියළුම ඉඩම් සඳහා ක්‍රියාත්මක කළ හැකිය.

10. වෙනත් කවර හෝ අතුරු නීතියක හෝ වෙනත් කවර හෝ නීතියක් යටතේ වන රෙගුලාසියක් ඊට පටහැනිව කවර හෝ කරුණක් දැක්වුණද, මෙම නියෝගයේ විධිවිධාන එලෙසම බලපැවැත්වෙනු ඇත. එපරිදි විධිවිධාන අතර කවර හෝ ගැටුමක් හෝ අනුකූලතාවක් නොපවතින අවස්ථාවක දී, 9 වැනි වගන්තියේ සඳහන් කර දක්වා ඇති වෙනත් කවර හෝ අතුරු නීති හෝ රෙගුලාසි අභිබවමින් 'අතුරු සංවර්ධන නියෝගය' බලාත්මක වනු ඇත.

11. මෙම නියෝගය අදාළ වන්නාවූ කවර හෝ ඉඩමක් සංවර්ධනය කිරීම පිණිස ආඥාපනතේ 45 වන වගන්තිය යටතේ බලපත්‍රයක් කවර හෝ අතුරු සංවර්ධන බලධරයකු මගින් කවර හෝ පුද්ගලයෙකු වෙත නිකුත් කළ හැක්කේ පහත සඳහන් අවස්ථාවල දීය.

(අ) පූර්වෝක්ත සංවර්ධන බලධාරියා, එකී ඉඩම් සඳහා අතුරු සංවර්ධන බලධාරියා වීම

(ආ) එකී පුද්ගලයා විසින්, ඒ සම්බන්ධයෙන් ලිඛිත අයඳුම් පත්‍රයක්, පූර්වෝක්ත සංවර්ධන බලධාරියා වෙත ඉදිරිපත් කොට තිබීම, සහ එම අයඳුම් පත්‍රය සමග, එකී ඉඩම (මෙහි මින් මතු 'ගෙපල සැලැස්ම' යනුවෙන් හඳුන්වනු ලබන) හඳුනා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි පිළියෙල කළ පිඹුරේ පිටපත් 3 ක්ද, යෝජිත සංවර්ධනය පිළිබිඹු කර දැක්වෙන ආකාරයකින් පිඹුරු හා සිතියම් මගින් පැහැදිලි කරන ලද විස්තර ද, ඉදිරිපත් කිරීම, කෙසේවතුදු, එකී පුද්ගලයන් විසින් ඉදිරිපත් කර ඇති විස්තර හා ගෙපල සැලැස්ම මගින්, යෝජිත සංවර්ධනය ප්‍රමාණවත් ලෙස පැහැදිලි කර ඇත්නම්, ගෙපල සැලැස්ම හැර පිඹුරු හා සිතියම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය බවට මෙම උප වගන්තියෙහි දැක්වෙන විධිවිධාන බල නොපානු ඇත.

(ඇ) එවැනි සංවර්ධනයක්, කලාපීය සැලසුම් කමිටුව විසින්, දළ කලාපීය සැලසුම් කෙටුම්පතට ඇතුළත් කිරීම සඳහා සලකා බලනු ලබන කිසිදු සංවර්ධන යෝජනාවක් සඳහා බලනොපා යුතුය.

(ඈ) සහ යෝජිත සංවර්ධන කටයුතු, අර්ධ වශයෙන් ප්‍රධාන මාර්ග සංවර්ධන ප්‍රදේශයක් තුළ පිහිටා ඇති විට, අදාළ බලධාරීන් එක්ව කටයුතු කළ යුතුය.

(ඉ) සහ අතුරු සංවර්ධන බලධාරීන් විසින් ඕනෑම විශේෂඥ සංවිධානයක් හෝ දෙපාර්තමේන්තුවක් සමග සාකච්ඡා කිරීමෙන් පසුව වැදගත් හෝ අත්‍යවශ්‍ය හෝ අදාළ අදහස හෝ මතය සළකා බැලිය යුතුයි.

12. ආඥාපනතේ හා මෙම නියෝගයෙහි අන්තර්ගත විධිවිධානවලට යටත්ව අතුරු සංවර්ධන බලධරයකු; විසින්

(අ) ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ කවර හෝ අයඳුම්කරුවෙක් වෙත බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ හැකිය.

(ආ) එකී බලපත්‍රය ප්‍රදානය කරනු ලබන්නේ කවර කොන්දේසිවලට යටත්වද යන්න නිර්ණය කොට බලපත්‍රයෙහි නිශ්චිත වශයෙන් දැක්විය හැකිය.

13. ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ කවර හෝ අයඳුම්කරුවෙක් වෙත බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට අතුරු සංවර්ධන බලධරයා විසින් ගනු ලබන සෑම තීරණයක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, එකී තීරණයට එළඹීමට හේතු කාරක වූ සාධක කවරේද යන්න දැක්විය යුතුය.

14. ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලබන සෑම පුද්ගලයකුම, එකී බලපත්‍රයේ සඳහන් කර දක්වා ඇති කොන්දේසි හා අනුකූල වන පරිදි කටයුතු කළ යුතුය.

15. මෙම නියමය යටතේ බලපත්‍ර ලබා ගැනීම සඳහා තමන් වෙත ඉදිරිපත් කරන ලද සියළුම අයඳුම්පත්‍ර පිළිබඳ ලේඛනයක් (මෙහි මින් මතු 'ලේඛනය' යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම අතුරු සංවර්ධන බලධරයකු විසින්ම පවත්වා ගෙන යා යුතු අතර, එකී එක් එක් අයඳුම්පත්‍රයට අදාළව පහත දැක්වෙන තොරතුරු එකී අයඳුම්පත්‍රයට ඇතුළත් කිරීමට කටයුතු කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.

(අ) අයඳුම්කරුගේ නම හා ලිපිනය

(ආ) අයඳුම් පත්‍රය අදාළ වන ඉඩමේ නම හා පිහිටීම

(ඇ) ඉදිරිපත් කළ අයඳුම් පත්‍රය මගින් සිදුකරනු ලබන සංවර්ධනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක්

(ඈ) එකී අතුරු සංවර්ධන බලධරයා විසින් මෙම නියෝගයේ 6 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී අයඳුම් පත්‍රය සම්බන්ධයෙන් අදාළ බලධාරීන් හෝ පුද්ගලයන් විමසා ඇත්නම්, එහි බලධාරීන් හා පුද්ගලයන් විසින් කරන ලද නිර්දේශ

(ඉ) අයඳුම් පත්‍රය පිළිබඳව එකී අතුරු සංවර්ධන බලධාරියාගේ තීරණය

(ඊ) අයඳුම්කරු වෙත බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබ තිබේ නම්, බලපත්‍රයේ සඳහන් කර දක්වා ඇති කොන්දේසි වේ නම්, එම කොන්දේසි

16. මෙම නියෝගය යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා තමා වෙත අයඳුම් පත්‍ර ඉදිරිපත් කරන සියළුම පුද්ගලයන් පිළිබඳව අකාරාදියට පිළියෙල කළ සුචි පත්‍රයක් සෑම අතුරු සංවර්ධන බලධරයකු විසින් පවත්වා ගෙන යා යුතුය. එක් එක් අයඳුම්කරුගේ නම හා ලේඛනයේ එම අයඳුම් පත්‍රයේ විස්තර සඳහන් කර ඇති පිටුවේ හෝ පිටුවල අංකත් එහි අන්තර්ගත කළ යුතුය.

17. මංමාවත්වලට සම්බන්ධව ඉඩම් සංවර්ධනය සඳහා අතුරු සංවර්ධන බලධාරියා විසින් යම් බලපත්‍රයක් නිකුත් කළ විට එම පාරේ පිහිටීම පිළිබඳව අකාරාදියට පිළියෙළ කළ සුචි පත්‍රයක් සෑම අතුරු සංවර්ධන බලධරයෙකු විසින් ම පවත්වා ගෙන යා යුතු අතර, එහි වරිපනම් අංකය ඇත්නම් එය ද, එම අයඳුම් පත්‍රයේ විස්තර සඳහන් කර ඇති පිටුවේ හෝ පිටුවල අංකයන් ද ඇතුළත් කිරීමට හෝ ඇතුළත් කරනු සඳහා කටයුතු කිරීමට ක්‍රියා කළ යුතුයි.

18. මෙම නියෝගයෙහි පද සම්බන්ධය මගින් වෙනත් ආකාරයක් හැඟේ නම් මිස -

(අ) 'අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව' හෝ 'සම්බන්ධීකරණ කමිටුව' යනුවෙන් අදහස් කරන්නේ ආඥාපනතේ 4 (අ) වගන්තිය යටතේ ස්ථාපිත අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවයි.

(ආ) 'සංවර්ධන' යන්නෙන් ආඥාපනතෙහි සඳහන් අරුථම අදහස් වන අතර, එහි ව්‍යාකරණමය විචල්‍යතාවන් හා සමාන වාක්‍ය විධිත් එපරිදිම වටහා ගත යුතු වේ.

(ඇ) 'සංවර්ධන ප්‍රදේශය' යනුවෙන් අදහස් වන්නේ ආඥාපනත යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ප්‍රදේශයකි.

(ඈ) කවර හෝ ඉඩමක් සම්බන්ධයෙන් වන සංවර්ධනය 'අතුරු සංවර්ධනයක්' යනුවෙන් අදහස් වන්නේ, එම ඉඩම පිහිටා ඇති සංවර්ධන ප්‍රදේශය හෝ එහි කොටසක් සඳහා සවිස්තර සැලැස්මක් සම්පාදනය කිරීම සඳහා ආඥාපනතේ නියමයන් *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද දිනයේ සිට ආරම්භව, ඒ පරිදි සම්පාදනය වන සැළසුම් බලාත්මක වන දිනයන් අවසන් වන කාලපරිච්ඡේදයයි.

(ඉ) 'පළාත් පාලන ආයතනය' යන්නෙන්

(I) මහ නගර සහා ප්‍රදේශයන් සම්බන්ධව යොදන කල්හි, එකී ප්‍රදේශය සඳහා වූ මහ නගර සභාව ද,

(II) 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ අර්ථය තුළ ගැනෙන නගරයක් සම්බන්ධයෙන් යොදන කල්හි එකී නගරය සඳහා වන නගර සභාව ද,

(III) 1946 අංක 3 දරන සුළු නගර සභා ආඥාපනතේ අර්ථය තුළ ගැනෙන නගරයක් සම්බන්ධයෙන් යොදන කල්හි 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ස්ථාපිත ප්‍රාදේශීය සභාවක් ද,

(IV) ගම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් යොදන කල්හි, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ස්ථාපිත ප්‍රාදේශීය සභාවක් ද,

(V) 'අමාත්‍යවරයා' යන්නෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයාද,

(VI) 'සැළැස්ම' යන්නෙන් ආඥාපනතේ යටතේ සම්පාදිත කවර හෝ සැලැස්මක් ද,

(VII) 'කලාපීය සැලසුම් කමිටුව' යන්නෙන් ආඥාපනත විධිවිධාන යටතේ ස්ථාපිත, නැගෙනහිර පළාත් කලාපීය සැලසුම් කමිටුව ද,

(VIII) 'නියෝගය' යන්නෙන් අතුරු සංවර්ධන නියෝගය ද,

(IX) 'බලධරයා' යන්නෙන් අතුරු සංවර්ධන බලධරයා ද අදහස් වේ.

(X) 'දෙපාර්තමේන්තුව' යන්නෙන් අදහස් වන්නේ පාර්ලිමේන්තුවේ පනතක විධිවිධාන අනුව පිහිටුවන ලද සහ කැබිනට් අමාත්‍යවරයෙකුගේ, රාජ්‍ය අමාත්‍යවරයෙකුගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන ඕනෑම රජයේ දෙපාර්තමේන්තුවක් හෝ අධිකාරියක්, මණ්ඩලයක් හෝ සංස්ථාවක් ය. නැගෙනහිර පළාත් සභාව යටතේ ක්‍රියත්මක වන පළාත් පාලන ආයතන ඇතුළු ඕනෑම දෙපාර්තමේන්තුවක් හෝ ව්‍යවස්ථාපිත අධිකාරියක් මෙයට ඇතුළත් වේ.

## I වැනි උපලේඛනය

නැගෙනහිර පළාතේ කලාපීය සංවර්ධන ප්‍රදේශය යනු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදි ජනරජ ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ අට වැනි උපලේඛනයේ සඳහන් කර දක්වා ඇත්තා වූද, අංක 2270/11 හා 2022 මාර්තු 8 දින දරන *ගැසට් පත්‍රයේ* උපලේඛනයේ සඳහන් කර දක්වා ඇත්තා වූද, ප්‍රදේශයයි.

## II වැනි උපලේඛනය

*අවසරලත් සංවර්ධනය*

(1) පහත දැක්වෙන සංවර්ධනයක් හැර කවර හෝ ලිඛිත නීතියක් මගින් අවසර දෙනු ලැබ ඇති සංවර්ධනය -

(අ) පවත්නා ගොඩනැගිල්ලක් ඉදිකිරීම, නැවත ඉදිකිරීම හෝ පුළුල් කිරීම
(ආ) මංමාවත් ඉදිකිරීම, පුළුල් කිරීම හෝ බෙදීම සහ
(ඇ) කවර හෝ ඉඩමක්, එහි කවර හෝ කොටසක් වෙන් වශයෙන් වූ ඉඩමක් වශයෙන් වන පරිදි නැවත බෙදීම

(2) රජයේ හෝ පළාත් පාලන ආයතනයක් මගින් ඉටු කෙරෙන, මෙම නියමය ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව අවසර දෙන ලද සංවර්ධනයක්

(3) 2 වැනි ඡේදයේ අරමුණු සම්බන්ධයෙන් කවර හෝ ඉඩමක සංවර්ධනය සඳහා අවසර දෙනු ලැබුවන් ලෙස සළකනු ලැබෙනුයේ -

(අ) කවර හෝ ලිඛිත නීතියක විධිවිධාන ප්‍රකාර, රජය මගින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් සංවර්ධනය සඳහා කවර හෝ කැමැත්තක්, බලයක් හෝ අනුමැතියකින් දෙනු ලැබ ඇත්නම්, හෝ

(ආ) සංවර්ධන අරමුණ සඳහා එකී ඉඩම අනිවාර්ය වශයෙන්ම උපයෝගි කර ගැනීමට අවසර දෙමින් රජය හෝ පළාත් පාලන ආයතනයක් මගින් නියමයන් නිකුත් කර ඇති කල්හි, හෝ

(ඇ) එකී සංවර්ධන අරමුණ උදෙසා ඉඩම වෙන් කර දීමට හෝ එකී අරමුණ උදෙසා ඉඩම අත්පත් කර ගැනීමට රජය විසින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් කැමැත්ත පළ කර ඇති කල්හි, හෝ

(ඈ) එකී සංවර්ධන අරමුණ උදෙසා මුදල් ණයට ලබා ගැනීම සඳහා හෝ වෙනත් ආකාරයකින් එපරිදි භාවිතා කොට ගත නොහැකි මුදලක්, එකී අරමුණ සඳහා උපයෝගි කරගැනීමට රජය විසින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් හෝ අවසර දී ඇති කල්හි, හෝ

(ඉ) සංවර්ධනය සඳහා ආධාර වශයෙන් යම් ප්‍රදානයක් සිදු කිරීමට රජය විසින් හෝ පළාත් පාලන ආයතනයක් මගින් කවර පොරොන්දුවක් දී ඇති කල්හි,

යන අවස්ථාවල දී වේ.

(4) පවත්නා ගොඩනැගිල්ලක බාහිර ස්වරූපය වෙත බලපෑමක් ඇති කරන්නාවූ හෝ එහි භාවිතය වෙනස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන්නා වූ හෝ වෙනස් කිරීමක් නොවන, එකී ගොඩනැගිල්ලේ නඩත්තුව සඳහා අවශ්‍ය වූ කවර හෝ වෙනස් කිරීමක්, කවර හෝ අලුත්වැඩියාවක් හෝ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීම.

(5) 4 වැනි වගන්තියෙහි අරමුණු උදෙසා 'පවත්නා ගොඩනැගිල්ල' යනුවෙන් අදහස් වන්නේ මෙම නියෝගය ක්‍රියාත්මක වන විට, ආරම්භ වීමට පෙරාතුව ඉදිකරන ලද හෝ ගොඩනගන ලද හෝ පෙරාතුව ආරම්භ කරන ලදුව එකී දිනයට පසු තනා නිම කරන ලද හෝ එකී දිනයට පෙරාතුව එය කොන්ත්‍රාත් ගිවිසුමක් ප්‍රකාර ඉදි කරන ලද හෝ ගොඩනගන ලද හෝ එකී ආඥාපනතේ හෝ මෙකී නියමයෙහි විධිවිධානයන් උල්ලංඝණය නොකරමින් වෙනත් ආකාරයකට ඉදි කරන ලද හෝ ගොඩනගන ලද ගොඩනැගිල්ලකි.

(6) ගොඩනැගිලි, ගංගා වේලි සහ ගල් හෝ කොන්ක්‍රීට්, ගඩොල් හෝ වානේ යොදා වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම, නැවත ඉදිකිරීම, වෙනස් කිරීම හෝ පුළුල් කිරීම පිළිබඳව අදාළ නොවන්නාවූ සංවර්ධනයක් වන ජලය, ගෑස් හෝ විදුලි බලය සැපයීම, වැඩිදියුණු කිරීම හෝ නඩත්තු කිරීම හා සම්බන්ධයෙන් අවශ්‍ය වන සංවර්ධනයන් -

(අ) ජල මාර්ග හෝ මතුපිට ජලාප්‍රවාහන මාර්ග සැපයීම, නඩත්තුව, වැඩිදියුණු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන සංවර්ධනය

(ආ) පොදු වැසිකිලි හැර වැසිකිළි හා ජල මුද්‍රිත වැසිකිළි ඉදිකිරීම ඇතුළුව මලාප්‍රවාහන හා යටිබිම් ජලවාහන පද්ධති සැපයීම, නඩත්තු කිරීම, වැඩි දියුණු කිරීම හෝ අළුත්වැඩියා කිරීම හා සම්බන්ධයෙන් අවශ්‍ය කරන සංවර්ධනය

(ඇ) යම් පූජෝත්සවයක් හෝ උත්සවයක් හෝ සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ස්ථිර හෝ තාවකාලික ව්‍යුහයන් ඉදිකිරීම

(ඈ) වීදි, මංමාවත් හෝ වෙනත් මහාමාර්ග ප්‍රතිසංස්කරණය, වැඩිදියුණු කිරීම හෝ අළුත්වැඩියා කිරීම හා සම්බන්ධයෙන් අවශ්‍ය වන සංවර්ධනය.

EOG 04 - 0119

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.